

# ඉන්දියාවේ ආරක්ෂක අවශ්‍යතාවලට ලංකාවෙන් හානියක් නෑ

## - ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ

■ නයන තරංග ගමගේ

ඉන්දියාවේ ආරක්ෂක අවශ්‍යතාවලට ශ්‍රී ලංකාව හානි නොකරන බව ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ ප්‍රකාශ කර ඇත. එසේම චීනය සමීප මිතුරකු ලෙස ඇතැමුන් හඳුන්වන නමුත්, ඉන්දියාව යනු ශ්‍රී ලංකාවේ සහෝදරයා බවද හෙතෙම පෙන්වාදී තිබේ.

නවදිල්ලි නුවරදී මාධ්‍යවේදීන් අමතමින් මහ කොමසාරිස්වරයා සඳහන් කර ඇත්තේ, චීනයේ පර්යේෂණ නෞකාවක් හම්බන්තොට වරායට පැමිණීමේ සිද්ධිය ඉන්දියාව සමග සමීප සහයෝගීතාවයේ සහ සම්බන්ධීකරණයේ අවශ්‍යතාවය පිළිබඳ පාඩමක් බවයි.

''ඉන්දියාවේ ආරක්‍ෂක අවශ්‍යතා අපේ ආරක්‍ෂක අවශ්‍යතා. ජනාධිපතිතුමා මේ බව පසුගියදා පැහැදිලි කළා. ඒ අවබෝධය තියෙනවා.'' යැයි මහ කොමසාරිස්වරයා පෙන්වාදී තිබෙන බව 'ට්‍රිබියුන්' ප්‍රවෘත්ති සේවය සඳහන් කරයි.

විවිධ රටවල් සමග පවතින සබඳතා සමතුලිත කිරීම අභියෝගයක් බව මෙහිදී මහකොමසාරිස්වරයා ප්‍රකාශ කර ඇති අතර, "ඉන්දියාව අපට ආරක්ෂාව සඳහා නැංගුරමයි. ආරක්ෂාව සම්බන්ධයෙන් ගත් කල, ප්‍රධාන සැපයුම්කරු ඉන්දියාවයි. කිසිදු ආරවුලක් නැත. මෙය සංකීර්ණ කාල පරිච්ඡේදයක් බව අපි ද හඳුනා ගනිමු. අපි මෙම අත්දැකීමෙන් ඉගෙන ගෙන ඇති අතර අපි අපවම නිවැරදි කර ගනිමු.'' යැයි ද හෙතෙම සඳහන් කර තිබේ.

"රාජපක්ෂවරු හැමදම කිව්වේ චීනය ඉතා සමීප මිතුරකු කියයි. නමුත් ඉන්දියාව අපේ සහෝදරයා සහ සහෝදරියයි. පවුලක් තුළ ඔබට රණ්ඩු විය හැකි නමුත් අවසානයේ එය ඔබේ පවුලයි" යනුවෙන් ද ඔහු වැඩිදුරටත් අවධාරණය කර ඇත.